ආයතනයේ නම : ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය

ප්‍රකාශන මාලා අංකය : 182/183

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

நிறுவனத்தின் பெயர் : போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சு

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119 (4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புகளும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திடம் சமர்ப்பித்தல்.

Name of the Institution: Ministry of Transport and Highways

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය

1. දුම්රිය දෙපාර්තමේන්තුව
2. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය
3. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
4. ජාතික ගමනාගමන කොමිෂන් සභාව

போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சு

1. புகையிரத திணைக்களம்
2. இலங்கை போக்குவரத்துச் சபை
3. இலங்கை மோட்டார் வாகன போக்குவரத்து திணைக்களம்
4. இலங்கை போக்குவரத்துச் சபை

Ministry of Transport and Highways

1. Department of Railways
2. Sri Lanka Transport Board
3. Department of Motor Traffic
4. National Transport Commission

ආයතනය - දුම්රිය දෙපාර්තමේන්තුව

සාකච්ඡා කරන ලද කරුණු	ආයතනික වශයෙන් ගනු ලැබූ පියවර සහ ඉදිරියේ දී ගැනීමට අපේක්ෂිත පියවර
01.ප්‍රධාන මෙහෙයුම් සැලැස්මක්සකස් කිරීමට නිදහස් කළ ප්‍රතිපාදන	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා ප්‍රධාන සැලැස්මක් සැකසීම සඳහා 2017 සැප්තැම්බර් මස 17වන දින ආසියානු සංවර්ධන බැංකුව මගින් ඇ.ඩො.මි. 1.5ක ප්‍රදානයක් අනුමත කරන ලදි. (TA No 9382 SRI) මෙම ප්‍රධාන සැලැස්ම සැකසීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව මගින් ජපාන උපදේශන සමාගමක් වන PADECO Co. LTD වෙත උපදේශන කොන්ත්‍රාත්තුව සෘජුවම පිරිනමා ඇත. දුම්රිය දෙපාර්තමේන්තුවේ එකඟත්වය මත 2020 – 2030 කාලය සඳහා මෙම සැලැස්ම පිළියෙල කරන ලදි. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්යයන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමෝපායිව දිශානතින් මෙම සැලැස්ම මගින් හඳුනාගෙන තිබෙන අතර මධ්‍ය කාලීන හා දිගු කාලීනව ආයෝජන ඇතුළත් කර ඇත. වර්තමානයේ රටේ පවතින තත්ත්වය යටතේ මෙවැනි විශාල ප්‍රාග්ධන ආයෝජන ක්‍රියාත්මක කිරීමේ සීමා ඇති අතර ප්‍රමුඛතාවයන් මත තෝරාගත් ව්‍යාපෘති පෞද්ගලික අංශයේ සහයෝගය යටතේ ක්‍රියාත්මක කිරීම කාලීනව වැදගත් වේ. මෙම කරුණු ද සැලකිල්ලට ගෙන දැනට සකස් කර ඇති ප්‍රධාන සැලැස්ම සඳහා සංශෝධන ඇතුළත් කර අවසන් දුම්රිය ප්‍රධාන සැලැස්ම සැකසිය යුතුව ඇත.
02.කැලණිවැලි දුම්රිය මාර්ග ව්‍යාපෘතිය	ආසියානු සංවර්ධන බැංකුවේ ණය ආධාර මත කොළඹ නදාසන්න දුම්රිය ව්‍යාපෘතිය මගින් කැලණිවැලි දුම්රිය මාර්ගයේ ශක්‍යතා අධ්‍යන කටයුතු නිම කරන ලදි. මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ණය ප්‍රදානයක් අපේක්ෂා කළ ද අදාළ ණය මුදල් මෙතෙක් නොලැබීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය තාවකාලිකව නවතා දමන ලදි.
03.විදේශ ආධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය	විදේශ ආධාර ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා , මාසිකව හෝ සති දෙකකට වරක් අදාල ව්‍යාපෘති අධ්‍යක්ෂ හා අමාත්‍යාංශයේ සහභාගීත්වයෙන් සිදු කරන බවද , ඊට අමතරව සෑම මාස 03 කට වරක් අමාත්‍යාංශ ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් යුක්ත මෙහෙයුම් කමිටු (Steering Committee) රැස් වන බව.

04.ඉන්දියානු ණය ආධාර යටතේ ඉන්දියාවෙන් මිල දී ගත් දුම්රිය මැදිරි 160කින් 103 ක් මේ වන විටත් භාවිතයට නොගැනීම	දුම්රිය දෙපාර්තමේන්තුව සතුව වැකියුම් බ්‍රේක් (Vacuum Brake) සහිත දුම්රිය මැදිරි භාවිතා කළ ද නව තාක්ෂණයෙන් යුතු එයාර් බ්‍රේක් (Air Brake) සහිත දුම්රිය මැදිරි ඉන්දියාව ඇතුළු ලෝකයේ අනෙක් රටවල භාවිතා වේ. මෙම ඉන්දියානු ණය ආධාර යටතේ දුම්රිය මැදිරි 160 සමඟ දුම්රිය එන්ජින් ද මිල දී ගැනීමට කටයුතු කර තිබූ අතර, එම දුම්රිය එන්ජින් එයාර් බ්‍රේක් (Air Brake) සහිත බැවින් මෙම දුම්රිය මැදිරි ඊට අනුකූලව එයාර් බ්‍රේක් (Air Brake) සහිතව සකස් කර ඇත. මෙම දුම්රිය මැදිරි මෙරට භාවිතයට නොගැලපෙන ඒවා නොවන අතර, මුල් මැදිරි 10ක් මෙරටට ගෙන්වා ධාවනය කර පරීක්ෂා කිරීමෙන් පසු සිදු කළ යුතුව තිබූ අඩුපාඩු නිවැරදි කිරීමෙන් අනතුරුව ඉතිරි මැදිරි ගෙන්වා ඇත. එසේ ගෙන්වන ලද මැදිරි මේ වන විට දුම්රිය ධාවනය සඳහා යොදවා ඇත. ධාවනයේ දී මතුවන තාක්ෂණික දෝෂ සම්බන්ධයෙන් ගිවිසුමේ සඳහන් පරිදි කටයුතු කරමින් පවතී.
05.විධිමත් ප්‍රවාහන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවීම	වේගවත් ආර්ථික වෘද්ධියක් අත්පත් කර ගැනීම සඳහා අවශ්‍යවන්නාවූ යටිතල පහසුකම් සීඝ්‍ර හා නවීන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සංවර්ධනය කිරීම රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව තුළ මූලික එකඟතාවයක් ලෙස පිළිගෙන තිබුණු බැවින් ,ප්‍රවාහන අංශය මඟින් ආර්ථිකයේ බලාපොරොත්තු වන වර්ධන වේගය සඳහා දායකත්වය සපයා ගැනීමට අවශ්‍යවන මූලික ප්‍රතිපත්තිමය එකඟතාව ඇතිකර ගැනීම සඳහා දැනට බලාත්මක ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය - 2009 යාවත්කාලීන කිරීම අවශ්‍ය බව නිරීක්ෂණය කරන ලදි. පවතින හා අපේක්ෂිත ප්‍රවාහන යටිතල පහසුකම් ප්‍රශස්ත ලෙස භාවිත කිරීම සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණය භාවිතය , ප්‍රවාහන ඉල්ලුම් කළමනාකරණය (Transport Demand Management) සහ ජී හා බැදුණු දත්ත පද්ධති සැකසීම මෙන්ම භාණ්ඩ හා බහාලුම් ප්‍රවාහනය විධිමත් කිරීම වැනි අංශවල පවතින හිඩැස අවම කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම මෙම යාවත්කාලීන කිරීම සඳහා බලපෑ සුවිශේෂී කාරණයකි. ඒ අනුව,දැනට බලාත්මක ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය - 2009 යාවත්කාලීන කිරීමෙන් පසු සැකසූ ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය - 2019 කෙටුම්පත ,2019.12.26 දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදි.

	එම කෙටුම්පත එවකට පැවති රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව වන " සෞභාග්‍යයේ දැක්ම " සමඟ දක්වන අනුකූලතාව පරීක්ෂා කිරීම සඳහා ප්‍රවාහන ක්ෂේත්‍රයේ විශේෂඥයින්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කර සුදුසු සංශෝධන තිබේ නම් ඉදිරිපත් කොට වාර්තාකරන ලෙසත් , එම සංශෝධන පාදක කරගනිමින් නැවත පිළියෙල කරන ලද ජාතික ප්‍රවාහන ප්‍රතිපත්ති කෙටුම්පත අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කරන ලෙසත් අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 19/3507/225/008 දරණ 2020.01.14 වන දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් දැනුම් දී ඇත. ඉහත තීරණය අනුව මහාචාර්ය ලලිතසිරි ගුණරුවන් මහතාගේ සභාපතීත්වය යටතේ සාමාජිකයින් 09 දෙදෙනෙකුගෙන් සමන්විත විශේෂඥ කමිටුවක් ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම් විසින් 2020.03.02 දින පත් කරන ලදි.එසේ පත්කරන ලදවිශේෂඥ කමිටුව පහත පාර්ශවකාරී ආයතන වලින් සමන්විත විය. 01.ප්‍රවාහන අමාත්‍යාංශය 02.මුදල් අමාත්‍යාංශය 03.ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව 04.විදේශ සම්පත් දෙපාර්තමේන්තුව 05.මොරටුව විශ්වවිද්‍යාලය 06.කොළඹ විශ්වවිද්‍යාලය 07.කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය - 2019 කෙටුම්පත , ඉහත විශේෂඥ කමිටුව මඟින් පුළුල් විශ්ලේෂණයකට ලක් කොට " සෞභාග්‍යයේ දැක්ම " නැමති එවකට පැවති රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව සමඟ දක්වන අනුකූලතාව සොයා බලා ඉදිරිපත් කළ නිර්දේශයන් සහිත කමටු වාර්තාව , 2020.08.23 වන දින පිළියෙල කොට අවසන් කරන ලදි. ඉන් අනතුරුව එම විශේෂඥ කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ පාදක කොට ගනිමින් යථෝක්ත කෙටුම්පතට අවශ්‍ය සංශෝධන සිදුකොට "ශ්‍රී ලංකාවේ ජාතික ගොඩබිම ප්‍රවාහන ප්‍රතිපත්තිය" සකස් කරන ලදි.කෙටුම්පත් කරන ලද මෙම "ශ්‍රී ලංකාවේ ජාතික ගොඩබිම ප්‍රවාහන ප්‍රතිපත්තිය" 2022.07.22 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කරන ලදි.එසේ වුවද එම කෙටුම්පතට අනුමැතිය හිමි නොවුනි. ඉන් අනතුරුව ප්‍රවාහන අමාත්‍යාංශයේ සැලසුම් අංශය විසින් ,

	මෙම ප්‍රවාහන ප්‍රතිපත්තිය නැවත පරීක්ෂා කර බලා එහි ඇතුලත්ව තිබූ ප්‍රතිපත්ති මූලධර්ම (Policy Principles), තර්කරාමු ප්‍රවේශයට අනුකූලව සංශෝධනය කරන ලද අතර , උක්ත කෙටුම්පතේ ඇතුළත් කර නොතිබූ ප්‍රතිපත්තියේ යම් යම් අඩුපාඩු පවතීනම් ඒවා සමාලෝචනයට අදාල පාර්ශවකරුවන් හඳුනාගන්නා ලදි. මෙම කෙටුම්පත 2023.01.13 දින පාර්ශවකරුවන් සමඟ සමාලෝචනයටලක්කර ඇති අතර 2023 පළමු කාර්තුව තුල අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර අනුමැතිය ලැබීමෙන් පසු ක්‍රියාවට නංවනු ලැබේ.
06.දුම්රිය ප්‍රවාහන සේවය කාර්යක්ෂම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග	• කාර්යාලයීය දුම්රියවල ඇති ප්‍රමාදය අවම කිරීම සඳහා අලුතින් මුහුදුබඩමාර්ගයේ උදැසන සහ කැලණිවැලි මාර්ගයේ දුම්රිය කාලසටහන් සංශෝධනය කර මේ වන විට ක්‍රියාත්මක කරනු ලබයි. • අළුත්ගම - ගාල්ල අතර සහ බෙලිඅත්ත - ගාල්ල අතර ධාවනය වන දුම්රිය සඳහා අමතර මැදිරිය බැගින් එක් කර ධාවනය කරනු ලබයි. • කැළනිවැලි මාර්ගයේ වග දුම්රිය ස්ථානය දක්වා නව කාර්යාල දුම්රියක් ධාවනයට යෙදවීම සහ එම දුම්රිය මේ වන විට කොස්ගම දුම්රිය ස්ථානය දක්වා ධාවනය කරවනු ලබයි. • කොළඹ කොටුව සහ මීගමුව අතර කාර්යාලයීය වේලාව තුළ නව දුම්රිය සේවා වාරයක් එක් කර ඇත. • සියළුම කාර්යයන් පිළිබඳ වැඩ අධ්‍යයනයක් සිදු කර (work study) සියළු අංශ නැවත ප්‍රතිසංවිධානය කර SOP සියලු දෙනා වෙත නිකුත් කිරීම. • දුම්රිය ප්‍රමාදයන්ට වගකිව යුතු අයම ප්‍රමාද වාර්තා ලබා දීම නිසා සමහර ප්‍රමාදයන් පිළිබඳ යථා තත්ත්වය වාර්තා නොවේ. එහෙත්, මගී ජනතාවඒ පිළිබඳ අපහසුතාවයට පත් වේ. ඒ නිසා ප්‍රමාද පිළිබඳ ස්වායීන කමිටුවකින් හෝ ආයතන මගින් සොයා බැලීම. • ධාවනය වන දුම්රියවල පිරිසිදුභාවය පවත්වා ගැනීම හා නඩත්තුව නිසියාකාරව කිරීමට අවශ්‍ය කම්කරු ශ්‍රමය ලබා දීම. • දුම්රිය නවත්වන අංගනවල පහසුකම් වැඩිදියුණු කිරීම. • කාර්මික ශිල්පීන්, දුම්රිය රියදුරන්, රියදුරු සහායකයින්, ෂන්ටින් රියදුරන් බඳවා ගෙන පුහුණු කිරීම. • මැදිරිවල හා එන්ජින්වල අලුත්වැඩියාවන් ප්‍රමාදවීමට හේතු විමසා බලා ඒවාට පිළියම් යෙදීම. • දුම්රිය කාල සටහන සහ දුම්රිය ධාවනය තිබෙන සම්පත් සමඟ ගලපා ගැනීම හා අනවශ්‍ය මගීන් අඩු දුම්රිය ධාවනය නැවැත්වීම.

	• ආදායම අඩු දුම්රිය ස්ථාන වසා දැමීම (අවම ජල බිල්පත හා විදුලි බිල්පත ආවරණය කර ගත නොහැකි) • ප්‍රවේශපත්‍ර සම්පූර්ණයෙන්ම (QR Code වැනි) Online ක්‍රමයකට නිකුත් කිරීම.හදිසි පරීක්ෂාවන් වැඩි කිරීම මගින් ප්‍රවේශපත්‍ර නොමැතිව ගමන්ගන්නා පිරිස හඳුනා ගැනීම. • Prepaid ක්‍රමයට ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම හා ඒවා පරීක්ෂාවට සරල උපකරණ ලබා දීම. • අනවශ්‍ය වියදම් නතර කිරීම. • ආදායම් වැඩි කිරීමට නිලධාරීන් දිරිමත් කිරීම. • වැඩ පරිසරය ක්‍රියාත්මක කිරීම. • සේවක විවේකාගාර පහසුකම් දියුණු කිරීම. • PPP ක්‍රමයේ ව්‍යාපෘති මගින් ආදායම් වැඩි කර ගැනීම. • ඩීසල් පරිභෝජනය සඳහා වන වියදම ඉතා අධික බැවින් ඒ සඳහා විධිමත් පාලන ක්‍රම ඇති කිරීම. • නඩත්තු කළමනාකරණයට මෘදුකාංග හඳුන්වා දීම. මාර්ග හා අංගන නඩත්තුව සිදු කර පරිසරය වැඩි දියුණු කිරීම

ආයතනය - ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය

සාකච්ඡා කරන ලද කරුණු	ආයතනික වශයෙන් ගනු ලැබූ පියවර සහ ඉදිරියේ දී ගැනීමට අපේක්ෂිත පියවර
07.වර්තමානයේ පවතින අර්බුදකාරී තත්ත්වය තුළ ධාවනය වන බස්රථ ප්‍රමාණය	බස්රථ ධාවනයේ දී බස්රථවල ගමන් ගන්නා මගීන් හට අනතුරු රහිතව ගමන් කිරීමේ හැකියාව ඇත්දැයි පරීක්ෂා කිරීම් හා නිවැරදි කිරීම් සිදු කරනු ලබයි.
08.රට තුළ පවතින ඉන්ධන හිඟය බස් සේවාව කෙරෙහි බලපා ඇති ආකාරය	QR කේත මගින් පුද්ගලික බස් රථ සඳහා ද අනෙකුත් පිරවුම්හල් මඟින් ඉන්ධන නිකුත් කරනු ලබන හෙයින් ශ්‍රී ලංගම ඩිපෝවන් තුළින් පුද්ගලික බස්රථ මඟින් ඉන්ධන ඉල්ලුම් කිරීම මේ වන විට අවම මට්ටමක පවතී. (ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය) පළාත් ප්‍රවාහන අධිකාරී බස්රථ සඳහා සතියක ඉන්ධන අවශ්‍යතාවයෙන් 60% ක් ද ජාතික ගමනා ගමන කොමිෂන් සභාවේ බස් රථ සඳහා සතියක ඉන්ධන අවශ්‍යතාවයෙන් 75% ක් ද ලබා දීමට බලශක්ති අමාත්‍යාංශය කටයුතු කළ අතර, එය අඛණ්ඩව ක්‍රියාත්මක කරගෙන යනු ලබයි. (ජාතික ගමනාගමන කොමිෂන් සභාව)
09.ශ්‍රී ලං.ග.ම. ඩිපෝ හරහා පෞද්ගලික බස් රථ වලට ලබා දෙන ඉන්ධන ඵලෙසම බස් රථ ධාවනය කිරීම සඳහා යොදා ගන්නේ ද යන්න සොයා බැලිය හැකි ලෙස පද්ධතිය සකස් කල යුතු බවට කාරක සභාවේ අවධාරණය කිරීම.	රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තා සම්බන්ධයෙන් ගනු ලැබූ පියවර හා නිරීක්ෂණ යටතේ ඉදිරි කාල සීමාව තුල පොදු ප්‍රවාහනය වඩා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට හා දියුණු කිරීමට කෙටි හා මධ්‍යකාලීනව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් ඇතුලත් කර ක්‍රියාත්මක සැලැස්මක් සකස් කරන ලෙස නිර්දේශ කර ඇත. මේ වන විට "ශ්‍රී ලංකාවේ ජාතික ගොඩබිම් ප්‍රවාහන ප්‍රතිපත්තිය", පාර්ශවකාර ආයතන, විද්වතුන් සහ අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතනවල නිලධාරීගේ සහභාගිත්වය සහිතව යාවත්කාලීන කර ඇත. භාෂාත්‍රිත්වයෙන්ම සකස්කල එම ප්‍රතිපත්තියසහ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ගරු ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගේ අනුමැතිය සඳහා 2023.03.21 දින ඉදිරිපත් කරන ලදි. එම ප්‍රතිපත්තියට සහ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසුව පාර්ලිමේන්තුවේ සභාගතකර

	බලාත්මක කල යුතුය. හඳුනා ගන්නාලද ප්‍රතිපත්ති රාමුව (Policy Framework) යටතේ ජාතික ගොඩබිම් ප්‍රවාහන ප්‍රතිපත්තියේ සමස්ත අරමුණ ලභා කරගනු පිණිස, සාක්ෂාත් කරගත යුතු සංරචකයන් වන ආංශික අරමුණු ද මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය තුල ඇතුලත් කර ඇත. අනතුරුව ආංශික අරමුණු ලභා කරගැනීම සඳහා වන උපායමාර්ග (statergies) මේ වන විටත් හඳුනාගෙන ඇති අතර, ඊට අදාල ක්‍රියාකාරකම් සහ කාලරාමුව (time frame) ඇතුලත්කර කෙටි හා මධ්‍යකාලීන ක්‍රියාත්මක සැලැස්ම, අනුබද්ධිත ආයතන වල සහභාගිත්වය සහිතව ඔවුන්ගේ එකඟතාවය මත සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකල යුතුය.

ආයතනය - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

සාකච්ඡා කරන ලද කරුණු	ආයතනික වශයෙන් ගනු ලැබූ පියවර සහ ඉදිරියේ දී ගැනීමට අපේක්ෂිත පියවර
20.ඊ- මෝටරින් ව්‍යාපෘතිය	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ඊ මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මේ වන විට හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේ පස් මහල් ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා ගැනීම සඳහා සැලසුම් කර ඇත. ඒ අනුව, රජයේ තක්සේරුකරුගේ අංක CM 1 /CMC /RP /1179 හා 2023.01.16 දිනැති ලිපිය මගින් එම ගොඩනැගිල්ලේ පළමු , දෙවන , තුන්වන , හතරවන සහ පස්වන මහල් සඳහා මාසික වෙළඳපොළ කුලිය රුපියල් 3,400,000.00 ක් ලෙස තක්සේරු කර ඒවා ඇත. එමෙන් ම ශ්‍රී ජීනරතන අධ්‍යාපන ආයතන පාලක සභාව විසින් ඉදිරිපත් කර ඇති 2022.01.02 දිනැති ලිපියේ සහ එම ලිපිය සමඟ අමුණා ඇති ඇමුණුම්වල සඳහන් පරිදි ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට යටත්ව ඉහත මාසික කුලී වටිනාකම ඉදිරිපත් කර ඇති බවත් , මාසික කුලී වටිනාකම ඉදිරි වසර 02 ක කාලයක් සඳහා බල පැවැත්වෙන පරිදි බදු ගිවිසුමට ඇතුලත් කර ගන්නා ලෙසත් , ගොඩනැගිල්ලේ හිමිකරු විසින් සියළු අළුත්වැඩියා සහ වරිපනම් බදු ගෙවීමේ පදනම මත ඉහත සඳහන් කුලී වටිනාකම වාර්තා කර ඇති බවත් ඉහත ලිපියෙන් වැඩිදුර දන්වා ඇත. **(මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව)**
	ගරු ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගේ MT /05/2023 අංක 2023.01.23 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලබා දී ඇති අමප අංක 22/1091/608/009 අංක සහ 2022/08/22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව , 2023.02.13 වන දින අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීමක් පවත්වා ඇති අතර , එම රැස්වීම් වාර්තාවට අනුව මුදල් , ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමා විසින් ඉදිරිපත් කර ඇති නිරික්ෂණ වල දක්වා ඇති කරුණු කෙරෙහි නිසි සැලකිල්ලක් යොමු කරමින් , මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවන පරිදි සහ තිරසර අයුරින් ඊ මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගත යුතු පියවරයන් සම්බන්ධයෙන් නිර්දේශ සහිත වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා පහත සංයුතියෙන් යුත් කමිටුවක් පත් කර ඇත.

	• අග්‍රාමාත්‍ය ලේකම් - අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය - සභාපති • තාක්ෂණ අමාත්‍යාංශ ලේකම් - තාක්ෂණ අමාත්‍යාංශ - සාමාජික • ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් - ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය • භාණ්ඩාගාරයේ ලේකම් විසින් නම් කරනු ලබන භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් - මුදල් අමාත්‍යාංශ • සභාපති - ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව - ලේකම් / කැඳවුම්කරු ඉහත කමිටුව 2023.02.21 වන දින රැස් වූ අතර එහිදී කමිටුවේ නිර්දේශ සහිත වාර්තාව ඉදිරි සති 02 ක් තුල ගරු අමාත්‍යතුමා විසින් නැවත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය. **(ප්‍රවාහන අමාත්‍යාංශය)**

ආයතනය - ප්‍රවාහන අමාත්‍යාංශය

සාකච්ඡා කරන ලද කරුණු	ආයතනික වශයෙන් ගනු ලැබූ පියවර සහ ඉදිරියේ දී ගැනීමට අපේක්ෂිත පියවර
පළමු කොටස : 90.00	**01. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබීම.** 2021 වර්ෂයට අදාළ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සම්පූර්ණයෙන්ම විගණකාධිපති වෙත යොමු කිරීමට පියවර ගෙන ඇති අතර, 2022 වර්ෂයට අදාළ මාසික සාරාංශයන් මේ වන විට විගණකාධිපති වෙත යොමු කිරීමට පියවර ගෙන ඇත. **02. වාහනයක් ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබීම** KX-3743 BMW කාර්රථයේ අලුත්වැඩියා කිරීම සඳහා ලක්ෂ 50කට අධික මුදලක් වැයවන හෙයින් ත්‍රීපුද්ගල කමිටු වාර්තාවට අනුව මෙම රථය අලුත්වැඩියා කිරීම ඵලදායී නොවන බව සඳහන් කර වාර්තා යොමු කළ අතර, මෙම රථය අමාත්‍යාංශය යටතේ ඇති දුම්රිය දෙපාර්තමේන්තුව අවශ්‍ය ද නැද්ද යන්න විමසා ලිපි යොමු කර ඇතත් මේ වනතෙක් පිළිතුරු ලබා නොදීම හේතුවෙන් මෙම වාහනයේ අපහරණ කටයුතු මේ වන තෙක් සිදු නොකර ඇති බවත් ඉදිරියේ දී අපහරණ කටයුතු සිදු කිරීමට කටයුතු සිදු කරනු ඇත. දුම්රිය දෙපාර්තමේන්තුව වෙත සිහි කැඳවීම් යොමු කිරීමට පියවර ගෙන ඇත. **03. වාහනවල ඉන්ධන දහන පරීක්ෂාව සිදු නොකිරීම** 2022 වර්ෂයේ මුල් කාර්තුවේ දී වාහන 03කට පමණ ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට කටයුතු සිදු කරන ලදි. (KD-4971 / KD-9204 / KI-1775)ඉන් අනතුරුව වාහනවල ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට උපදෙස් හා අනුමැතිය ලබා නොදුන් හෙයින් දහන පරීක්ෂාව සිදු නොකරන ලදි. ඉදිරියේ දී අමාත්‍යාංශ සංචිත වාහනවල ඉන්ධන දහන පරීක්ෂා කටයුතු වරකදි වාහන 03 බැගින් සිදු කිරීමට කටයුතු කිරීම. අප්‍රේල් මස සිට ඉන්ධන දහන පරීක්ෂාව ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සැළසුම් කර ඇත. **04.වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂයක් පැවතීම** **අනු අංකය** | **නම** | **විස්තරය** 01. | ඒ.ඩබ්.ඒ.යූ.ජේ.අලහකෝන් මහතා (රු.198,138/=) | විධිමත් පරිදි නිවාඩු අනුමත කිරීමකින් තොරව සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් 2014.02.28 දින සිවිල්

			ගුවන්සේවා අමාත්‍යාංශ සේවයේ යෙදී සිටියදී සේවය හැරයාමේ නියෝගය නිකුත් කර ඇත. නිලධාරියා විසින් සේවයේ හැරයාමේ නියෝගයට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනය කර ඇත.එම අභියාචනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිෂ්ප්‍රභ කර ඇත. එම තීරණයට එරෙහිව අභියාවක විසින් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත.එම තීන්දුව ලැබෙන තෙක් පෞද්ගලික ලිපි ගොනුවද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඇත. පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය විසින් තීන්දුවක් මෙතෙක් ලබාදී නොමැත. එතෙක් ණය ශේෂ අයකර ගැනීමේ කටයුතු රදවා තබා ඇත.
	02.	කේ.පී.එම්.ඩී.ඩයස් මහතා (රු112,964/=)	2023.03.20 දින පැවති හිඟ ණය ශේෂය (රු112,964/=) සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කරන ලදී.
	03.	එච්.එම්.බණ්ඩාර මහතා (රු.87,600/=)	පැවති සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශ සේවයේ යෙදී සිටියදී 2015.12.01 දින සේවය හැරගොස් ඇත. ණය ශේෂ ගෙවන ලෙස ලිපිමඟින් කිහිපවරක්ම දැනුම් දුන්නද ප්‍රතිචාර දක්වා නොමැත. එම ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධව නෛතික කටයුතු සිදුකරන ලෙස ගරු නීතිපතිතුමා වෙත දැනුම් දෙන ලදී. මෙම නඩුවෙහි සිතාසි කැඳවීම 2023.06.27 දිනට නියමිතව ඇත.
	04.	පී.ඩබ්.එම්.පී.පොඩිමැණිකේ මිය (රු. 121,945/=)	ඉතාලි රටේ රැකියා ලබාදෙන බව පවසා මුදල් ලබාගෙන එම එම විදේශ රැකියා ලබා නොදීම පිළිබඳව කීපදෙනෙකු විසින් කරන ලද පැමිණිල්ලක් සලකා බලා 2013.03.08 දින 'බී' වාර්තාවක් මඟින්

			අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු වරද පිළිගැනීම නිසා සිර දඩුවම් නියම කර ඇත. තවද බාහිර පුද්ගලයින් කීපදෙනෙකු වෙන වෙනම ඉදිරිපත් කර ඇති පැමිණිලි වෙනුවෙන් වෙන වෙනම නඩු අංක යටතේ කීපයක් පවරා නඩු වලටද වෙන වෙනම සමාන දඩුවම් පමුණුවා ඇත. මෙම කරුණු සියල්ල සලකා බලා මෙම නිලධාරිනිය වැඩ තහනම් කල දිනයේ සිට සේවයෙන් පහ කර ඇත. සේවයෙන් පහ කිරීමේ නියෝගයට එරෙහිව පී.ඩබ්.එම්.පී.පොඩිමැණිකේ මිය විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාවනය එම කොමිෂන් සභාව විසින් නිෂ්ප්‍රභ කර ඇත. මේවන විට පී.ඩබ්.එම්.පී.පොඩිමැණිකේ මිය මේ සම්බන්ධයෙන් පරිපාලන අභියාවන විනිශ්චය අධිකාරිය වෙත අභියාවනය කර ඇති අතර මීළඟ කැඳවීම 2023 පෙබරවාරි මසට යෙදී ඇත. පරිපාලන අභියාවන විනිශ්චය අධිකාරියේ තීරණය ලබාදෙන තෙක් ණය ශේෂ අයකර ගැනීමේ කටයුතු රදවා තබා ඇත. තවද **2023.03.31** තෙක් ණය ශේෂය ගෙවීමට සහන කාලයක් ලබාදී ඇත.

05. අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවා ගෙන තිබීම.

රාජ්‍ය ප්‍රතිපත්තිය මත සංවර්ධන නිලධාරීන් 61 දෙනෙකු මෙම අමාත්‍යාංශය වෙතද අනුයුක්ත කරඇත. තවද පෙර පැවති රාජ්‍ය අමාත්‍යාංශය වෙත අමාත්‍යාංශීය වීඩියෝ කැමරා ශිල්පිනිලධාරියෙකු අනුයුක්ත කල අතර ඔහු මේ වන විට රා.ප.ව.14/2022 අනුව දේශීය නිවාඩු ලබා ගෙන ඇත.

දෙවන කොටස : 59.00	සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි සකස් කර ඇත . මානව සංවර්ධන සැලැස්ම සකස් කොට අවසන් කර ඇත .කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් පුහුණු වැඩසටහන් 2020 වර්ෂය තුල පැවැත්වීමට නොහැකි විය. මේ වන විට ජනජීවිතය යථා තත්වයට පත්ව ඇති බැවින් පුහුණු සැලැස්මක් සකස් කර ඒ යටතේ නිලධාරීන්ට පුහුණු

	වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදුවේ .ඒ අනුව එක් සේවකයකුට අවම වශයෙන් වර්ෂයකට පැය 12ක පුහුණුවක් ලබා දීමට හැකි උපරිම පියවර ගැනීමට කටයුතු කර ඇත.මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) පත් කොට ඇත.සමස්ත කාර්ය මණ්ඩලය සඳහා කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතවීමටද අවශ්‍ය කටයුතු මේ වර්ෂය තුල සිදු කරනු ඇත.

එම්.එම්.පී.කේ.මායාදුන්නෙ
ලේකම්
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය